# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2416/10 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 17 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

1A - PG 6957 - 19 (2024/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බලංගොඩ නාගරික බලප්‍රදේශය

### උපලේඛනය I

*I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කල අංක 100/4 හා 1980.08.04 දින දරන රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ නාගරික ප්‍රදේශයට අයත් වන්නා වූ බලංගොඩ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයට අයත්වන ග්‍රාම නිලධාරී වසම් වන බලංගොඩ නගරය, පල්ලෙකන්ද, කිරිමැටිතැන්න යන ග්‍රාම නිලධාරී වසම් ද, ඉඹුල්පෙ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයට අයත්වන මොරහැල ග්‍රාම නිලධාරී වසම ද, අංක 1741/5 දරන 2012/01/17 දිනැති *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද (256ඒ) බලංගොඩ නගරය, (256) බලංගොඩ කොට්ඨාසය (කොටසක්), (250බී) දෙහිගස්තලාව කොට්ඨාසය (කොටසක්), (255සී) තලංගම කොට්ඨාසය (කොටසක්), (256සී) තුඹගොඩ කොට්ඨාසය (කොටසක්), (256බී) කිරිදිගල කොට්ඨාසය (කොටසක්), (255බී) කුමාරගම කොට්ඨාසය (කොටසක්), (264ඩී) ඕලුගන්තොට කොට්ඨාසය (කොටසක්), (255ඒ) ඇල්ලෙපොල කොට්ඨාසය (කොටසක්), (250) කිරිමැටිතැන්න කොට්ඨාසය (කොටසක්), (254එෆ්) බුලත්ගම (කොටසක්), යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අමතරව, (256) බලංගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (250බී) දෙහිගස්තලාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (255සී) තලංගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (256සී) තුඹගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (256බී) කිරිදිගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (255බී) කුමාරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (255ඒ) ඇල්ලෙපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (250) කිරිමැටිතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (254එෆ්) බුලත්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඉතිරි කොටස ද, (252බී) විකිලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය ද (250ඒ) තොටුපලතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය ද අයත් වන්නා වූ මෙහි II තීරුවෙන් විස්තර වන්නා වූ මුළු භූමි ප්‍රමාණයයි.

*II වන තීරුව*

*උතුරට :*

රාස්සගල මාර්ගයේ මධ්‍යම රේඛාව සහ බුලත්ගම වසමේ බටහිර මායිම ඡේදනය වන ආරම්භක ලක්ෂයේ සිට වයඹ, නැගෙනහිර සහ ගිණිකොණ දෙසට එකී වසමේ බටහිර, උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ බුලත්ගම වසමේ නැගෙනහිර මායිම හා තුඹගොඩ වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට තුඹගොඩ වසමේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව තුඹගොඩ වසමේ නැගෙනහිර මායිම කිරිදිගල වසමේ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට කිරිදිගල වසමේ බටහිර හා උතුරු මායිම ඔස්සේ ගිණිකොන දෙසට නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2012.01.17 දිනැති 1741/5 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත බල ප්‍රදේශ මායිම් හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2012.01.17 දිනැති 1741/5 අංක දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත මායිම් ඔස්සේ කිරිදිගල වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද වේ.

*නැගෙනහිරට :*

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කිරිදිගල වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ සහ දකුණු දිශානුගතව දෙහිගස්තලාව වසමෙහි උතුරු හා නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද එතැන් සිට දෙහිගස්තලාව වසමෙ හි නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දිශානුගතව තොටුපොළතැන්න වසමෙ හි උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමෙ හි උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ නැගෙනහිර සහ දකුණුදිශානු ගතව විකිලිය වසමෙ හි උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී විකිලිය වසමෙ හි උතුරු මායිම ඔස්සේ ගිනිකොණ දිශානුගතව බලංගොඩ කල්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂය දක්වා ද.

*දකුණට :*

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට විකිලිය වසමෙ හි නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ දකුණු සහ වයඹ දිශානුගතව තලංගම වසමෙ හි නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී තලංගම වසමෙ හි නැගෙනහිර, දකුණු සහ බටහිර මායිම් ඔස්සේ දකුණු, බටහිර සහ උතුරු දිශානුගතව ඇල්ලෙපොල වසමෙ හි බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසමෙ හි බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට කොළඹ බලංගොඩ ප්‍රධාන මාර්ග යේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂය දක්වා ද.

*බටහිරට :*

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කොළඹ බලංගොඩ මාර්ගය ඡේදනය කරමින් ඇල්ලෙපොල වසමෙ හි බටහිර මායිම ඔස්සේ ඊසාන දිශානුගතව බලංගොඩ වසමෙ හි දකුණු මායිම හමුවන ලක්ෂය

දක්වා ද, එතැන් සිට බලංගොඩ වසමෙ හි දකුණු හා බටහිර මායිම් ඔස්සේ බටහිර සහ උතුරු දිශානුගතව තුඹගොඩ වසමෙ හි දකුණු සහ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන්සිට තුඹගොඩ වසමෙ හි බටහිර මායිම ඔස්සේ උතුරු හා වයඹ දෙසට බුලත්ගම වසමෙ හි දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට බුලත්ගම වසමෙහි දකුණු හා බටහිර මායිම් ඔස්සේ බටහිර සහ උතුරු දිශානුගතව රාස්සගල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ආරම්භක ලක්ෂය දක්වා ද වේ.

EOG 12 - 0236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.